# තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය

## 1. අරමුණ

මෙම තිරසාරත්ව ප්‍රතිපත්තිය මගින් පාරිසරික, සාමාජීය සහ පාලන (ESG) මූලධර්ම සඳහා LOLC ෆිනෑන්ස් පීඑල්සී හි කැපවීම දක්වා ඇති අතර, අපගේ තීරණ ගැනීමේ සහ මෙහෙයුම් ක්‍රියාවලිහිදී මෙන්ම මූල්‍ය විසඳුම් සඳහා තිරසාරභාවය ඒකාබද්ධ කරයි. කාර්ය මණ්ඩලයේ සියල්ලන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ කොටස්කරුවන් සඳහා එය මාර්ගෝපදේශ රාමුවක් ලෙස කටයුතු කරයි.

## 2. දැක්ම සහ මෙහෙවර

**දැක්ම:** පරිසරය සුරකිමින්, දේශගුණික විපර්යාසයට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරමින්, ශ්‍රී ලංකාවේ බැංකු නොවන මූල්‍ය අංශය තිරසාර හා සියල්ලන් ඇතුළත් මූල්‍යකරණයක් කරා මෙහෙයවීම.

**මෙහෙවර:** ප්‍රජාවන් සවිබලගන්වන, ස්වාභාවික සම්පත් සුරකින, යහ පාලනය තහවුරු කරන වගකිවයුතු මූල්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම.

## 3. උපායමාර්ගික කැපවීම

ජාතික සහ ජාත්‍යන්තර යාන්ත්‍රණයන්ට අනුකූල වූ පාරිසරික භාරකාරත්වය, සාමාජීය වගකීම සහ ශක්තිමත් පාලනයක් උදෙසා LOFC කැපවී සිටී.

## 4. පාරිසරික, සාමාජීය සහ පාලන (ESG) වගකීම්

### 4.1 පාරිසරික වගකීම්

පාරිසරික තත්වයන් වැඩි දියුණු කිරීම උදෙසා පරිසරය ආරක්ෂා කිරීමට, LOFC හි අනුකූලතාවන්ට අදාළ වගකීම් ඉටු කිරීමට සහ පාරිසරික කළමනාකරණ පද්ධතිය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට LOFC කැපවී සිටී. පරිසරය ආරක්ෂා කිරීමට ඇති කැපවීමේ අරමුණ වන්නේ, පරිසර දූෂණය වැළැක්වීම තුළින් අහිතකර පාරිසරික බලපෑම් වැළැක්වීම පමණක් නොව, LOFC හි ක්‍රියාකාරකම්, නිෂ්පාදන සහ සේවාවන් නිසා ඇතිවන හානි වලින් ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමයි. LOFC මෙහෙයුම්වලට අදාළ සියලුම පාරිසරික, නීතිමය සහ අනෙකුත් අවශ්‍යතාවන්ට පූර්ණ අනුකූලතාවයක් සහතික කිරීම අපගේ ප්‍රයත්නයන්ට ඇතුළත් වන අතර, ඒවා පහත කරුණුවලට සීමා නොවේ;

- ✓ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සහ කාබන් උදාසීනත්වය,
- ✓ සම්පත් වගකීමෙන් භාවිතය සහ අපද්‍රව්‍ය නිකුත්වීම අවම කිරීම,
- ✓ ජෛව විවිධත්වයට සහාය වීම සහ වගකිවයුතු ඉඩම් භාවිතය,
- ✓ ශක්තිමත් ආයෝජන පිරික්සුම සහ හරිත හා සමාජ මූල්‍යකරණ ඇතුළු තිරසාර මූල්‍යකරණය
- ✓ ජාත්‍යන්තරව පිළිගත් යාන්ත්‍රණයන් අනුව සකසා ඇති SLFRS S1 සහ SLFRS S2 ට අනුකූල තිරසාරභාවයට අදාළ ස්වේච්ඡා මූල්‍ය හෙළිදරව් කිරීම්

අධීක්ෂණය සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) මත පදනම්වූ ක්‍රියාකාරිත්වය හරහා අපි අපගේ පාරිසරික කළමනාකරණ පද්ධතිය (EMS) අඛණ්ඩව වැඩිදියුණු කරන්නෙමු. හවුල්කාරිත්ව පාරිසරික වගකීමට සහාය වීම සඳහා සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ ප්‍රජාවන් අතර දැනුවත්භාවය සහ සහභාගීත්වය එමඟින් ශක්තිමත් වනු ඇත.

## 4.2 සාමාජීය කැපවීම්

LOFC, සිය ආයතනික සමාජ වගකීම් වැඩසටහන් හරහා අර්ථවත් සමාජීය බලපෑමක් ඇති කිරීමට කැපවී සිටී. මානව හිමිකම්, කම්කරු ප්‍රමිතීන් සහ සුරක්ෂිත වැඩ පරිසර තත්වයන් ඉහළ නංවමින් අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සවිබල ගැන්වීම, ව්‍යවසායකත්වයන් පෝෂණය කිරීම සහ, සමාජ සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම උදෙසා අපි සියල්ලන් ඇතුළත් සහ වගකිවයුතු මූල්‍යකරණයක් ක්‍රියාකාරී ලෙස ප්‍රවර්ධනය කරමු. ස්ත්‍රී පුරුෂ සමානාත්මභාවය, විවිධත්වය සහ සමාන අවස්ථා වැඩිදියුණු කිරීම අපගේ ආයතනික වටිනාකම්වල මූලිකාංග ලෙස පවතී.

## 4.3 පාලනයේ කැපවීම්

තිරසාරභාවයෙන් යුතු පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් සමන්විත තිරසාරත්ව කළමනාකරණ කමිටුවක සහාය ඇතිව එමඟින් තිරසාරභාවය පිළිබඳ ඒකකයට උපායමාර්ගික සහාය සපයයි. තිරසාරභාවය පිළිබඳ ඒකකය පාරිසරික, සාමාජීය සහ පාලන (ESG) වැඩසටහන්ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු අතර වගවීම, නියාමන අනුකූලතාව සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෑම කාර්තුවකම (ESG) යාවත්කාලීන කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරයි.

මෙම තිරසාරත්ව ප්‍රතිපත්තිය LOFC හි සියලුම අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන් වෙත සන්නිවේදනය කළ යුතු අතර, වෙනස්වන නියාමන, වෙළඳපොළ සහ තිරසාරත්ව අපේක්ෂාවන් සමඟ අදාළත්වය පවත්වාගැනීම සහ අනුකූලවීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන පරිදි වාර්ෂිකව හෝ අඟහු ලෙස සමාලෝචනය කෙරේ.

**හසිනි සිරිවර්ධන**
**තිරසාරත්ව කළමනාකරු**
**2026 මාර්තු 30**